රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 328

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1986 මැයි මස 08 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

## සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් ලෙස සේවය කිරීම සඳහා ගෙවීම්

අංක: 382 දරණ 1981.12.04 දිනැති හා අංක:415 දරණ 1983.10.28 දිනැති ආයතන චක්‍රලේඛ ලිපිවලින් අනුමත කරන ලද ගෙවීම් පහත සඳහන් අයුරු 1986 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇත.

| | | | |
|---|---|---|---|
| (I) | මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක්/තනතුරු සඳහා පුද්ගලයෙකු/පුද්ගලයන් පත්කිරීම සඳහා තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | – | සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන එක් පුද්ගලයෙකු සඳහා රු:7.50(රුපියල් හතයි ශත පනහක්) බැගින්. |
| (II) | මාණ්ඩලික ශ්‍රේණි ඇතුලත, ශ්‍රේණියක සිට ශ්‍රේණියකට උසස් කිරීම සඳහා නිලධරයකු/නිලධරයන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | – | සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන එක් නිලධාරියෙකු සඳහා රු:5/= (රුපියල් පහක්) බැගින්. |
| (III) | මාණ්ඩලික නොවන ශ්‍රේණියේ තනතුරකට පුද්ගලයෙකු/පුද්ගලයන් පත්කිරීම සඳහා හෝ මාණ්ඩලික නොවන ශ්‍රේණිය ඇතුළත උසස් කිරීම සඳහා නිලධරයෙකු/නිලධරයන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | – | සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන එක් නිලධාරියෙකු සඳහා රු:2.50 (රුපියල් දෙකයි ශත පනහක්) බැගින්. |
| (IV) | සුළු සේවක ශ්‍රේණියේ තනතුරකට පුද්ගලයෙකු/පුද්ගලයන් පත්කිරීම සඳහා හෝ සුළු සේවක ශ්‍රේණි ඇතුළත උසස් කිරීම සඳහා නිලධරයෙකු/නිලධරයන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම | – | සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන එක් පුද්ගලයෙකු සඳහා රු: 1/= (රුපියලක්) බැගින්. |

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.